2016.07.08

REFERENCE ONLY

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2016

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය : පැය 2 යි

විභාග අංකය : ........................................

7 ශ්‍රේණිය

### I කොටස

■ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

■ ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. (i) අබරං මාමා කුකුළා අතින් අරන් ම ආවා දැයි අම්මා ඇසුවාය.

1. කුකුළෙක් අරගෙන 2. උදැසනින් ම
3. ප්‍රමාදවී 4. තනියෙන් ම

(ii) සුනිමල් කිඹුල් කඳුළු හෙළයි.

1. බොරු කනගාටුවක් දක්වයි. 2. කනගාටුවක් නොදක්වයි.
3. කඳුළු වගුරයි. 4. කිඹුලා හඬයි.

■ පහත දී ඇති වාක්‍යයේ සඳහන් මහාප්‍රාණ අක්ෂර සහිත වචන දෙකක් තෝරා ලියන්න.

02. සිංහල ලේඛනයෙහි මහාප්‍රාණ අක්ෂර හමුවන්නේ පාලි හා සංස්කෘත භාෂාවලින් ගත් ඇතැම් වචන ලිවීමේ දී පමණි.

1. ........................................ 2. ........................................

■ සඤ්ඤක අක්ෂරයක් සඳහන් නොවන පදයක් සහිත පද පෙළිය තෝරන්න.

03. (i)
1. කුඹුක් ගස, අඬහැරය, බඳිනවා, කැඳ
2. පඹුපුල් අසුන, බන්ධනය, සොඳ, අඹ
3. අහල, අඳන කඩය, ගිජිඳු, පඹයා
4. වඳිනවා, සුවඳ, පිඹිනවා, රඳවනවා

(ii)
1. හඬ, පළිඟු, හොඬය, කවිඳු
2. වඳ, ගඟ, ඉඳුං, තුරඟ
3. වළඳ, අඹ, පඹුවස්නුවර, ඔළිඳ
4. කඹය, ලඹය, කඳ, පඬිතුමා

■ අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

04. (i) 1. පාඨශාලාව, ශිෂ්ටාචාරය, ග්‍රන්ථ, වර්ධනය
2. ප්‍රතිඵල, සමස්ත, ප්‍රස්ථාරය, අර්ථය
3. වාර්තාව, ලේකම්, ලේඛනය, නිෂ්පාදනය
4. ධෛර්ය, ඓතිහාසික, ඖෂධ, පුස්තකාලය

(ii) 1. විශිෂ්ට, කාර්යාලය, සූර්‍ය, නිශ්චිත
2. නිශ්චල, තත්ත්වය, ශ්‍රේෂ්ට, කෞශල්‍ය
3. වර්ෂාව, ආචාර්ය, පරිඝනකය, ප්‍රදේශ
4. පර්යේෂණ, නිර්මාණ, තාක්ෂණය, ශිල්පියා

■ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු අක්ෂරය වරහන තුළින් තෝරා ලියන්න.

05. (i) ඉස්ලාම් භක්තිකයන් කුරා......ය (ණ - න) අනුව කටයුතු කරන බවට .....මැද (ළ - ල) අත තබා දිවිරයි.

(ii) විජිතපුර බ...... කොටුව (ළ - ල) ජය ගත් ගැමුණු රජතුමා ශ්‍රේ......ඨ (ශ් - ෂ්) පාලකයෙකි.

■ 'ෂ - ශ - ස' අක්ෂර හඳුන්වන නාමයන් පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

06. (i) 1. තාලුජ - දන්තජ - මූර්ධජ
2. මූර්ධජ - දන්තජ - තාලුජ
3. දන්තජ - මූර්ධජ - තාලුජ
4. මූර්ධජ - තාලුජ - දන්තජ

(ii) පහත සඳහන් වචනයේ ඇති පිල්ලම් පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

තොරතුරු

1. කොම්බුව - ඇලපිල්ල - ඇලපිල්ල - පාපිල්ල
2. කොම්බුව - ඇලපිල්ල - පාපිල්ල - පාපිල්ල
3. කොම්බුව - ඇලපිල්ල - පාපිල්ල - ඇදය
4. කොම්බුව - ඇදය - ඇලපිල්ල - පාපිල්ල

■ ඉදිරියෙන් දී ඇති පදයට නොගැළපෙන වචනය සහිත පද පේළිය තෝරන්න.

07. (i) 1. නාම විශේෂණ - සුදුනංගී, සුවඳපුෂ්පය, සිඟිතිමුහුණ , සුදුනයා
2. යුගල පද - අනංමනං, බඩුමුට්ටු, දුකසැප, පොත්පත්තර
3. විරුද්ධ පද - පිරිසිඳු - අපිරිසිඳු, යහපත් - අයහපත්, කුසල - අකුසල, මළ - නොමළ
4. නිපාත පද - පිණිස, හෙවත්, හෝ, කැටුව

REFERENCE ONLY

(ii) ඉදිරියේ දී ඇති පදයට සමාන අර්ථයක් නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. දත් - දන්ත, චූර්ණ, දසන්, දළ
2. අඹර - අහස, නුබකුස, ගගන , නබෝගැබ
3. පාසල - සිප්හල, පාඨශාලාව, විදුබිම, විදුහල
4. මව - දිනිතිය, මාතා, අම්මා, මැණී

■ පහත සඳහන් වාක්‍යවල ඇතුළත් අනුක්ත පද තෝරා ලියන්න.

08. (i) ගුරුවරු සිසුන් යහමග යවති. ..................................................

(ii) සෙබලුන් විසින් සතුරෝ පරාජය කෙරෙති ..................................................

■ හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

09. (i) වෛද්‍යවරයා ලෙඩුන් පරීක්‍ෂා .............................. (කරයි - කරති)

(ii) කුමාරිකාව මල් .............................. (නෙළයි - නෙළති)

10. (i) .............................. දුම්රිය නැවතුම්පොළ ට ගියා ය. (අම්මා - තාත්තා)

(ii) .............................. කුඹුර කෙටුවේය. (ගොවියා - ගොවිහු)

11. (i) .............................. පාසල් ගියෙහි. (නුඹ - නුඹලා)

(ii) .............................. රැඟුම් නරඹමු. (අපි - මම)

12. (i) ගංගා ගලා .............................. (බසියි - බසිති)

(ii) පුෂ්පයෝ විකසිත .............................. (වෙයි - වෙති)

■ ප්‍රථම පුරුෂ අතීත කාල බහු වචන ආඛ්‍යාතය තෝරන්න.

13. (i) 1. කළෙහු 2. කළෙමු 3. කළෝය 4. කළෙහි

(ii) 1. නෙළයි 2. නෙළති 3. නෙළුවෝය 4. නෙළත්

■ පහත සඳහන් වාක්‍යයේ අනවසාන ක්‍රියාව හා අවසාන ක්‍රියාව තෝරා ලියන්න.

14. ළමයි වතුරට පැන සෙල්ලම් කළ අතර, ගොවියෝ ගොයම් කැපූහ.

(i) අවසාන ක්‍රියාව - ..............................................

(ii) අනවසාන ක්‍රියාව - ..............................................

■ පහත සඳහන් අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

15. (i) නුසුදුසු අයෙකුට තානාන්තරයක් ලැබීම.

..............................................................................................

(ii) ස්ථිර තීරණයක් ගැනීමට නොහැකි වීම.

..............................................................................................

■ පහත සඳහන් පද අතරින් උපසර්ග පදයක් නොමැති පද පේළිය තෝරන්න.

16. (i) 1. අභිමානය, අඩිපාර, දුසිරිත, අවගුණය
2. විදේශ, සුදන, දුදන, සුසිල්වත්
3. අවලස්සන, උපගුරු, දුබල, අපද්‍රව්‍ය
4. අනුනායක, පරසිත, උපනායක, සුරකිව්

(ii) 1. සුපිරිසිදු, පිළිමල්, අනුමාන, නිදුක්
2. දුගඳ, ගුවන, පබල, අවමාන
3. අවමඟුල්, උපදෙස්, සුගඳ, පිළිවදන්
4. සුවිනීත, පිළිවෙළ, ඉම්හිරි, ඉපැරණි

■ දී ඇති අදහසට ගැළපෙන තනිපද ලියන්න.

17. (i) දෙවියන් වැඩ වසන ලෝකය - ..............................................

(ii) සිරිපා කරුණා කරන කණ්ඩායමේ නායකයා - ..............................................

2016 - 07 - 08
සිංහල භාෂාව හා සාහිත්‍ය
7 ශ්‍රේණිය.

REFERENCE ONLY

■ පහත සඳහන් වාක්‍යවල පද නිවැරදිව වෙන් කර ලියන්න.

18. (i) ඉලෙක්ට්‍රෝනිකඅපද්‍රව්‍යපරිසරයටහානිකරවන්නේය.

.............................................................................................................

(ii) නෑනැයන්නඑපාසර්ලාඑනකම්ඉමු.

.............................................................................................................

■ මෙහි සඳහන් වාක්‍යයේ උපමාව හා උපමේය වෙන් කර ලියන්න.

19. (i) ඇයගේ සිත වෙඩරු පිඩක් සේ උණු විය.

උපමාව - .............................. උපමේය - ..............................

(ii) කුසගින්නේ සිටි නිහන්නාට ලැබුණ බත් පාර්සලය අමෘතය බඳු විය.

උපමාව - .............................. උපමේය - ..............................

■ මෙහි සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදා ලියන්න.

20. (i) කවුද අයියේ කොහේ ද කලාතයා ඉන්නේ

.............................................................................................................

(ii) නෑ නෑ ඒවා අයිති දුම්රිය ස්ථානයට

.............................................................................................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

■ පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05ක ට පිළිතුරු ලියන්න.

01. ඔබ පංති කාමරය තුළ ඉටු කළ ඇගයීම ඇසුරින් පිළිතුරු ලියන්න.

(i) ඔබ බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම සඳහා තෝරා ගත් මාතෘකාව කුමක් ද?

(ii) එය ඉටු කිරීමේ දී අවශ්‍ය තොරතුරු සපයා ගත් ක්‍රම 02 ලියන්න.

(iii) එම මාතෘකාව තුළින් සමාජයට දුන් පණිවිඩය කුමක් ද?

(iv) මෙම නිර්මාණය කිරීමේ දී ඔබට මතු වූ ගැටලු 02ක් ලියන්න.

(v) බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට සුදුසු කාලීන මාතෘකා 02ක් ලියන්න.

(ලකුණු 10)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150ක ට නො අඩු රචනයක් ලියන්න.

(i) වැඩිහිටියන් රැක බලා ගනිමු.

(ii) ගංවතුරෙන් ගම විනාශ වූ දින

(iii) මා ගිය විනෝද චාරිකාව

(iv) පොදු දේපල සුරකිමු.

(v) අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මං සලසයි.

(ලකුණු 20)

03. පාසල අසල භූමියක කුණු කසළ ගොඩගැසීමෙන් ඇතිවන පරිසර දූෂණයට විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට ලිපියක් ලියන්න.

නැතහොත්

ඔබේ පාසලේ පැවැත්වීමට තීරණය කර ඇති චිත්‍ර ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත යැවීමට සුදුසු ආරාධනා පතක් සකස් කරන්න. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අහිකුණ්ඩික ජනතාව සංචාරක ජීවිතයක් ගත කරන ජන කොට්ඨාසයකි. ඔව්හු ගමින් ගමට යමින් නාගයින් හා රිළවුන් නටවමින් ද ශාස්ත්‍ර කියමින් ද ජීවිකාව කරති. මොවුහු තාවකාලික වාසස්ථාන තනා ගෙන ජීවත් වෙති. එක් ගමක දින හතකට වඩා රැඳෙන්නේ නැත. සැතපුම් දහයක් පමණ දුරින් තවත් තැනෙක වාසස්ථාන තනා ගෙන තවත් දින හතක් ඒ ප්‍රදේශයේ වාසය කරති. මෙලෙස ඔව්හු රට පුරා සංචාරය කරමින් දිවි ගෙවති. කණ්ඩායම් දෙකක් එක ම ගමක වාසය කරන්නේ ද නැත. වසරකට වතාවක් ලංකාවේ වාසය කරන සියලු ම අහිකුණ්ඩික මිනිස්සු එක තැනකට රැස්වෙති. රැස් වී කණ්ඩායම් අතර ආවාහ විවාහ කටයුතු ද ණය ගනුදෙනු ආදිය ද සිදුකර ගනිති. ඊළඟ අවුරුද්දේ කරන වැඩ කටයුතු හා සංචාරය කරන ප්‍රදේශ පිළිබඳ තීරණය කරන්නේ ද මෙම මහා සම්මේලනයේ දී ය.

REFERENCE ONLY

(i) මෙම ජන කොට්ඨාසය කුමන ජීවිතයක් ගත කරන පිරිසක් ද?

(ii) ඔවුන් ජීවත්වීම සඳහා කරනු ලබන දේවල් දෙකක් ලියන්න.

(iii) මෙම පිරිස එක ගමක රැඳෙන්නේ දින කියක් ද?

(iv) මොවුන් වසරකට වතාවක් රැස් වී කරනු ලබන දේවල් දෙකක් ලියන්න.

(v) පහත වචනවල විරුද්ධ පද ලියන්න.

1. තාවකාලික - ..................................
2. තිරණය - .................................. (ලකුණු 2 x 5 = 10)

05. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න

(i) එවිට දිසාපාමොක් ආචාරි කියන්නාහු "ඉදිරියේ දී පාටව කෙරෙමි" යි කියා අතවැස්සන දෙන්නකුන් ලවා දැත් තර කර අල්ලා උණ පත්තෙන් පාර කිපයක් ගස්වා පාටව කරවූහ.

1. මෙම සිද්ධිය සම්බන්ධව පාටව කළේ කා හට ද?
2. ඉරි ඇඳි පදවල අර්ථය ලිහිල් කර ලියන්න.

(ii) සුර රද සමන් සුරඟන එවර
පැහැ නද මදාරා පරසතු මල් පතර
කැර පුද වඩින රැඳි මුනි සිරිපා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

1. මෙම පද්‍ය සඳහන් කෘතිය රචනා කර ඇත්තේ කවුරුන් ද?
2. පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

සුර රද - ..................................

තඹර - ..................................

සකි - .................................. (ලකුණු 5 x 2 = 10)

06. පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(i) 'ගොවි බිරියගේ නුවණ' කුමන රටක ජන කතාවක් ද?

(ii) සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ 02 ක නම් ලියන්න.

(iii) එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමියන් විසින් රචිත ග්‍රන්ථ 02 ක නම් ලියන්න.

(iv) සිලිලාරෙක පෙල්මැලි
පෙති අතරින් සැලි සැලි ..... යන මෙම පද්‍ය පංතිය කාගේ නිර්මාණයක් ද?

(v) 'ලෝවා මහා පාය' කාගේ නිර්මාණයක් ද?

(ලකුණු 10)

07. පහත සඳහන් දෙබස් කා විසින් කාහට කියන ලද්දක්දැයි ලියන්න.

(i) තොපි මරණ නළලේ තබා අවු ද?

කා විසින් කියන ලද්දක් ද? ..........................................

කා හට කියන ලද්දක් ද? ..........................................

(ii) මම දැන් මේ හතර දෙනාට භාර දෙනවා සකස් කර ගත් සංවාද හතරක්

කා විසින් කියන ලද්දක් ද? ..........................................

කා හට කියන ලද්දක් ද? ..........................................

(iii) හැම පැත්තෙන් ම හැම තැනින් ම අම්බරුවන් කමතට ගන්නේ නෑ

කා විසින් කියන ලද්දක් ද? ..........................................

කා හට කියන ලද්දක් ද? ..........................................

(iv) ඇයි ඉතින් ගැළවෙන විදියක් ඔබ ම කල්පනා නොකරන්නේ?

කා විසින් කියන ලද්දක් ද? ..........................................

කා හට කියන ලද්දක් ද? ..........................................

(v) අම්බරුවන් පිට කමත් කරන්න.

කා විසින් කියන ලද්දක් ද? ..........................................

කා හට කියන ලද්දක් ද? ..........................................

(ලකුණු 2 x 5 = 10)